# කිරිහල හා සුභසාධක ආපනශාලාව බදුදීම - 2025 / 2026

# පරිසර අමාත්‍යාංශය

## <u>ලංසු කැඳවීම</u>

## කිරිහල හා සුහසාධක ආපනශාලාව බදුදීම - 2025 / 2026

01. පරිසර අමාත්‍යාංශයේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් කිරිහල හා සුහසාධක ආපනශාලාව බදුදීම සඳහා ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| ආයතනය | ලංසු ආරක්ෂණය | |
|---|---|---|
| | මුදලින් හෝ බැංකු ඇපකරයක් ලෙස | ලංසු ලියවිලිවල වටිනාකම රු. (ආපසු නොගෙවන) |
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල බදුදීම 2025/2026 | 96,000.00 | 5,000.00 |
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහසාධක ආපනශාලාව බදුදීම 2025/2026 | 10,000.00 | 3,000.00 |

02. ඉහත සේවාවන් සඳහා ඉල්ලුම්කරන ආයතන අදාළ සේවාවන් සඳහා වලංගු ලියාපදිංචියක් සහිත පිළිගත් ආයතනයක් විය යුතුය.

03. ලංසු ආකෘති කොන්දේසි හා අනෙකුත් විස්තර පේරාදෙණිය, අංක 14 හි පිහිටි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් 2025.04.10 වන දින සිට 2025.04.29 වන දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා (ආපසු නොගෙවන) මුදලක් ගෙවා ලංසු ලියවිලි ලබා ගත හැකිය. ලංසු ලියකියවිලි ලබා ගැනීම සඳහා ව්‍යාපාර ලිපි ශිර්ෂයකින් කෙරෙන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. ලංසු කොන්දේසි පිළිබඳව හොඳින් අධ්‍යනය කර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ආකෘති පිටපත් දෙකකින් යුක්තව (මුල් පිටපත හා අනු පිටපත) 2025.04.30 වන දින පෙ.ව.11.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,අංක 14, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුවේ. එසේ නැතිනම් ලංසුපත් අතින් ගෙනවිත් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි නිල කාමරයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටියට බහාලිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසුපත් බහා එවන කවර විවෘත කළ හැකි ස්ථාන සීල් තබා එවිය යුතු අතර, එම කවරයේ වම්පස ඉහල කෙලවරේ අදාල කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කල යුතුය. 2025.04.30 වන දින පෙ.ව.11.00 ට ලංසුපත් භාරගෙන අවසන්වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ එකි ලංසු විවෘත කරනු ලැබේ.

06. ලංසු සුරක්ෂණය ඉහත සඳහන් පරිදි මුදලින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැකි අතර එසේ නොමැති නම් ලංසුපත් සමඟ ඉහතින් දක්වා ඇති මුල්‍ය වටිනාකමකින් යුත් ලංසු සුරක්ෂණ බැඳුම්කරයක් රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මඟින් අධ්‍යක්ෂ ජනරාල් - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් 2025.07.30 දින දක්වා වලංගු වන පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඇප බැඳුම්කර ඉදිරිපත් කර නොමැති ලංසුපත් සලකා බැලීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.මේ සඳහා බැංකු මඟින් නිකුත් කරන චෙක්පත් හා බැංකු ගෙවීම් අණකර භාරගනු නොලැබේ.

07.ලංසුපත් පිළිබඳ තීරණ ගැනිමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතින්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාල කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබාදීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ. මේ පිළිබඳ වැඩිමනක් විස්තර දුරකථන අංක 081-2388654 මඟින් ප්‍රධාන ගණකාධිකාරි අමතා ලබාගත හැකිය.

සභාපති.
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2025.04.09

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල බදු දීම - 2025/2026

### ලංසු කොන්දේසි පත්‍රය

**1.හැඳින්වීම**

I. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන ගේට්ටුව අසල කිරිහල පවත්වාගෙන යාම සඳහා තෝරා ගන්නා ලංසුකරුහට කිරිහල පිහිටි ගොඩනැගිල්ල පමණක් කිරිහල පවත්වා ගෙන යාම සඳහා භාර දෙනු ලැබේ.

II. උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට හා උද්‍යානයේ කාර්ය මණ්ඩලයට ආහාර පාන සැපයීමට බදුකරුට හැකියාව ඇත.

**2.ලංසු ඉදිරිපත් කිරීමට ඇති සුදුසුකම්**

I. ලංසුකරු ව්‍යාපාර නාම ආඥාපනත යටතේ වසර 5කට පෙර ලියාපදිංචි වී තිබිය යුතු අතර එය සනාථ කිරීම සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුයි. සමාගම් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන්නේ නම් සාංගමික සංස්ථාවලියේ පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

II. ලංසු මිල ගණන් පත්‍රය සමග, ලංසු කොන්දේසි පත්‍රය, ආකෘති අංක 1,2,3,4 හා 5ද ව්‍යාපාරය නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමේ 2025 වර්ෂයේ ආසන්න අනුයාත මාස 3ක බැංකු ප්‍රකාශන වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. මීට පෙර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ගතවී ගිවිසුම් කඩකර ඇති හෝ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග නීති මගින් කටයුතු කරන අයකුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට මෙම ලංසු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අයිතිවාසිකම් නැත්තේය.

**3.පළපුරුද්ද**

**I.** ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන ලංසුකරු විසින් උසස් අන්දමින් කිරි ආශ්‍රිත ආහාර ඇතුලුව වෙනත් ආහාර සැපයීම සම්බන්ධයෙන් හා මෙවැනි කිරිහලක් පවත්වාගෙන යාම පිළිබඳ අඩුම වශයෙන් අවුරුදු 03කවත් සතුටුදායක පළපුරුද්දක් හෝ වෘත්තීය පුහුණුවක් හෝ අධ්‍යාපනයක් ලබා තිබිය යුතුය.

**II.** දෙස් විදෙස් සංචාරකයින් අධික ප්‍රමාණයක් පැමිණෙන මෙම ස්ථානයේ ඔවුනට උසස් සේවාවක් අඛණ්ඩව සැපයීමේ හැකියාව ඇති බව සනාථ කිරීම සඳහා ආකෘති අංක 4 ලංසු ලියවිලි සමග ඉදිරිපත් කිරීම ඇගයීමට භාජනය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පළපුරුද්දක් නොමැති වුවද ආකෘති අංක 4 හිස් වාර්තාවක් ලෙස අත්සන්, දින, නිල මුද්‍රා තබා ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති ලංසුපත් අසම්පූර්ණ ලංසු පත් ලෙස සලකා ඇගයීමට භාජනය කරනු නොලැබේ.

III. නිශ්චිත ස්ථානයක මෙවන විටත් මෙවැනි කිරිහලක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයකු වීම ඇගයීමේදී සලකා බලනු ලැබේ.

**4.ලංසු සුරක්ෂණය**

I. ලංසුකරු ලංසු ලියවිලි සමග රු.96,000/-ක් (රුපියල් අනූහය දහසක්) වටිනා ලංසු ඇපකරයක් 2025.07.30 දින දක්වා වලංගු කොන්දේසි විරහිත බැංකු ඇප බැඳුම්කරයක් රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල බදුදීම සඳහා ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

II. එසේ නොමැති නම් මුදලින් රු.96,000/-ක් (රුපියල් අනූහය දහසක්) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ලබාගන්නා පොදු 172 ලදුපතේ මුල් පිටපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

III. චෙක්පත් හෝ බැංකු අණකර භාරගනු නොලැබේ. වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොමැති ලංසු ඇගයීමට භාජනය නොකෙරේ.

**5.මිල ගණන් පත්‍රය**

I. රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල පවත්වාගෙන යාම සඳහා තෝරා ගන්නා ලද ලංසුකරු විසින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත මසකට රු. 800,000/-කට (රුපියල් අට ලක්ෂයකට) නොඅඩු වැට් රහිත බදු මුදලක් සහ ඊට අදාලව රජය විසින් පනවා ඇති අනුපාත යටතේ (18%) වැට් බදු (VAT) මුදලද මාසිකව ගෙවිය යුතුය.

II. ලංසුකරු ඉදිරිපත් කරනු ලබන ලංසු පිටපත් දෙකෙහිම ලංසු කරනු ලැබූ මුදල අකුරින්ද ඉලක්කමින්ද සඳහන් කළ යුතුය. අකුරින් සඳහන් කළ මුදලට වෙනස් මුදලක් ඉලක්කමින් සඳහන් කර ඇති විටකදී අකුරින් සඳහන් කළ මුදල ඇගයීමට භාජනය කරනු ලැබේ.

III. ලංසුකරු විසින් ලංසු ලියවිලි පැහැදිලි අත් අකුරින් නියමිත පරිදි අත්සන්, දින, නිල මුද්‍රා යොදා ඉදිරිපත් කළ යුතු අතර යමක් සංශෝධනය කිරීමට අවශ්‍ය නම් තනි ඉරකින් කපා කෙටි අත්සන් යෙදීම කළ යුතුය. එසේ නොමැතිව ටිපෙක්ස් කර, මකා හෝ කටුගා ඇති විටකදී ලංසුව ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

IV. ලංසු පත්‍රය සමග ඉදිරිපත් කර ඇති ආකෘති අංක 2 අනුව ආහාර පාන මිල ගණන් ලැයිස්තුවද නියමිත අත්සන්, දින හා මුද්‍රා තබා ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. ආකෘති පත්‍රයේ අඩංගු සියලුම ආහාර පාන සඳහා මිල ගණන් සම්මත බර සමග ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ලංසු ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

V. ආකෘති අංක 2හි සඳහන් කර නොමැති අමතර ආහාර පාන කිසිවක් අලෙවි කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ආකෘති අංක 3 අනුව සම්මත බර සමග මිල ගණන් ඉදිරිපත් කළ හැක. එසේ අමතර ආහාර පාන කිසිවක් අලෙවි කිරීමට බලාපොරොත්තු නොවන්නේ නම් අකෘති අංක 3 හිස් වාර්තාවක් ලෙස නියමිත අත්සන්, දින හා නිල මුද්‍රා තබා ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. ආකෘති අංක 3 මගින් අමතර ආහාර පාන සඳහා මිල ගණන් ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු අතර පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VI. ලංසු ප්‍රදානය කිරීමෙන් පසු බදුකරු විසින් කිරිහලේ අලෙවි කිරීමට බලාපොරොත්තු වන සියලුම ආහාර පාන සහ වෙනත් ද්‍රව්‍ය වල සම්පූර්ණ විස්තරයක් සහ ඒවායේ මිල ගණන් ලැයිස්තුවක් කිරිහල ඉදිරිපිට මහජනතාවට දර්ශනය වන අයුරින් ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

**6. ලංසුව සමග ඉදිරිපත් කළ යුතු පහත ලේඛණ ලංසු ලේඛණයේ අනුපිළිවෙලින් අමුණා ඉදිරිපත් කළ යුතුය.**

I. ලංසු මිල ගණන් පත්‍රය(ආකෘති අංක 1)
II. ලංසු සුරක්ෂණය
III. ව්‍යාපාර නාම ලියාපදංචි සහතිකයේ ඡායා පිටපත (සමාගමක් නම් සමාගම් ලියාපදිංචිය සමඟ සාංගමික සංස්ථාපත්‍රයේ ඡායා පිටපතක්ද ඉදිරිපත් කළ යුතුයි)
IV. ලංසුකරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත
V. ආහාර පාන මිල ගණන් පත්‍රය (ආකෘති අංක 2)
VI. අමතර ආහාර පාන මිල ගණන් පත්‍රය (ආකෘති අංක 3)
VII. පළපුරුද්ද පිළිබද ආකෘති පත්‍රය (ආකෘති අංක 4)
VIII. සමාන ව්‍යාපාර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාල පළාත් පාලන ආයතනයෙන් තහවුරු ලේඛණ
IX. අත්සන් කරන ලද ලංසු කොන්දේසි පත්‍රය
X. පසුගිය අනුයාත ආසන්න මාස 3ක බැංකු ප්‍රකාශන වල පිටපත්
XI. පිරික්සුම් ලැයිස්තුව (ආකෘති අංක 5)
XII. දිවුරුම් ප්‍රකාශය

**7.ලංසු ඉදිරිපත් කිරීම**

I. පුවත්පත් දැන්වීමේ සඳහන් පරිදි ලංසු ආකෘති හා අනෙකුත් විස්තර ලබා ගැනීම පිණිස ආපසු නොගෙවන රු.5,000.00ක මුදලක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලදුපත ඉදිරිපත් කර ලංසු ආකෘති ලබාගත යුතුය.

II. ලංසු කොන්දේසි පත්‍රය ඇතුළු <u>ආකෘති අංක 1,2,3,4,5 එම ආකෘති වලම</u> සම්පූර්ණ කර නියමිත පරිදි අත්සන්, දින , නිලමුද්‍රා තබා ඉදිරිපත් කිරීම **අනිවාර්යය වේ.**

III. එම ලංසු ආකෘති මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් 2කින් ඉදිරිපත් කළ යුතු අතර මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවර 2ක බහා මුද්‍රා තැබිය යුතු අතර එම කවර වල ලංසුකරුගේ නම, ලිපිනය, මුල් පිටපතද අනු පිටපතද යන වග පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

IV. එම කවර 2 කම එකම කවරයක බහා මුද්‍රා තබා ලංසුකරුගේ නම හා ලිපිනය එම කවරයේ සඳහන් කළ යුතු අතර එහි වම්පස ඉහළ කෙලවරේ “පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල බදු දීම-2025/2026” ලෙස සඳහන් කළ යුතුය.

V. ලංසුපත් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපතිවරයා වෙත ලියාපදිංචි කළ තැපැලෙන් හෝ පේරාදෙණියේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි නිළ කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර බහාලිය යුතුය.

VI. ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2025.04.30 දින පෙ.ව.11.00ට ලංසු විවෘත කරනු ලැබේ.

**8.ලංසු ඉවත් කර ගැනීම**

I. ඉදිරිපත් කළ ලංසුවක් ඉවත් කර ගැනීමට අවශ්‍ය නම් 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැන්විය යුතුය. එම දැන්වීම 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි නිළ කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

II. ලංසු විවෘත කළපසු ඉදිරිපත් කළ කිසිදු ලංසුවක් ඉවත් කරගැනීමට නොහැකි අතර ඉදිරිපත් කළ ලංසුව 2025.07.30 දින දක්වා වලංගු විය යුතුය. ලංසු විවෘත කිරීමෙන් පසු ලංසු ඉවත් කර ගන්නා බවට ලැබෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන අතර ලංසු සුරක්ෂණය රාජ සන්තක කිරීමට කටයුතු කර අසාදුගත සැපයුම්කරුවන්ගේ ලේඛණයට එම ලංසුකරු ඇතුලත් කරනු ලැබේ.

**9.ලංසු විවෘත කිරීම**

I. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 2025.04.30 දින පෙ.ව.11.00ට පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේදි ලංසු විවෘත කරනු ලැබේ.

II. මේ සදහා ලංසුකරුට හෝ ඔහුගේ එක් නියෝජිතයෙකුට සහභාගි වීමට හැක.

III. ඉදිරිපත් වී ඇති ලංසු මිල ගණන් එම අවස්ථාවේදී ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ප්‍රකාශයට පත් කරනු ඇත.

**10. ලංසු වල වලංගුභාවය**

I. ලංසු විවෘත කළ දින සිට දින 90ක් දක්වා ලංසුව වලංගු විය යුතුය.

**II.** ඉදිරිපත් කළ මිල ගණන් ස්ථාවර විය යුතු අතර නැවත මිල සංශෝධනය කර ඉල්ලීම් ඉදිරිපත් නොකළ යුතුය.

**III.** එවැනි ඉල්ලීම් ඇගයීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසුවද ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ලංසු විවෘත කිරීමෙන් පසු මිල සංශෝධනය කරනු ලබන ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂණය රාජ සන්තක කරනු ලැබේ.

**11. ලංසු භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම**

I. සම්පූර්ණ ලංසුවම හෝ ලංසුවෙන් කොටසක් භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිට අයිතිය ඇත්තේය.

II. මෙම දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක/ආයතනයක මෙවැනි කිරිහලක් හෝ ආපන ශාලාවක් පවත්වාගෙන ගොස් කොන්දේසි කඩ කරන ලද හෝ රජයට කළයුතු ගෙවීම් පැහැර හරින ලද හෝ වෙනත් මොනයම් හෝ දූෂණයක් / වංචාවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ වරදකරු වී සිටින ආයතන හෝ පුද්ගලයින් ඉදිරිපත් කරනු ලබන ලංසුපත් ප්‍රතික්ෂේප කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත්තේය.

**12. කාර්ය සාධන ඇපකරය**

I. සිය ලංසුව පිළිගෙන තිබෙන බවට වූ ලිඛිත දැන්වීම ලැබී වැඩ කරන දින 10ක් ඇතුලත අදාල ලංසුකරු විසින් කාර්යසාධන ඇපකරයක් වශයෙන් වාර්ෂික බදු මුදලෙන් 10%කට නොඅඩු මුදලක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මුදලින් හෝ රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් බදු කාලසීමාවෙන් ඔබ්බට දින 28ක් දක්වා වලංගු අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහලබදුදීම සඳහා කාර්ය සාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

II. තවද මාසික බදු මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් මාසික බදු මුදල හා ජල, විදුලි, වරිපනම් බදු සඳහා දෙපාර්තමේන්තු තැන්පතුවක් ලෙස ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මුදලින්ද තැන්පත් කල යුතු වේ

III. එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කලහොත් හෝ ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දුන් විට නොපැමිණිය හොත් හෝ තමා සමග ගිවිසුමකට ඇතුලත්වන ලෙස දැන්වූ විට නොපැමිණිය හොත් හෝ කිරිහල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තමන්ට සුදුසු යයි හැඟෙන වෙනත් විකල්ප විධිවිධාන යෙදීමේ පූර්ණ අයිතිය ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

IV. බදුකරු විසින් කොන්දේසි කඩකිරීම හේතුවෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට කිසියම් අලාභයක් සිදුවුවහොත් එයද ලංසුකරුගෙන් අයකරනු ලැබේ. එවැනි අවස්ථාවලදි ලංසුකරු විසින් මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් තබා ඇති ඇප මුදල් රාජ සන්තක කරන අතර ඔහුගේ නම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අසාදුගත ලංසුකරුවන්ගේ ලේඛණයට ඇතුලත් කරනු ලැබේ.

**13. ගිවිසුම් අත්සන් කිරීම**

I. තෝරාගත් බදුකරු ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමක් අත්සන් කල යුතු අතර එම ගිවිසුම එක් මසක දැනුම් දීමක් ඇතිව ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ටද, තුන්මසක දැනුම්දීමක් ඇතිව බදුකරුටද අවලංගු කිරීමට ක්‍රියාකල හැකිය.

II. ගිවිසුම අවලංගු වන දින ලංසුකරු ශ්‍රී ලංකා ජනරජයේ දේපල ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට හෝ නිසි පරිදි භාර දී අදාල වෙළඳ සැලෙන් ඉවත්විය යුතුය.

## 14. ගිවිසුමේ වලංගු කාලය

I. තෝරාගත් ලංසුකරු බදු මුදල් නිසි පරිදි ගෙවමින් උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන ආකාරයට කිරිහල පවත්වා ගෙන යන්නේ නම් වර්ෂයක ගිවිසුම් කාලයකට පවත්වා ගෙන යාමට ඉඩ දෙනු ලැබේ.

## 15. බදු මුදල් ගෙවීම

I. කිරිහලෙහි ආහාරපාන සැපයීමේ අයිතිය ලබාදීම වෙනුවෙන් තෝරාගන්නා ලද බදුකරු විසින් ගිවිසුම් ප්‍රකාරව එකගව වූ බදු මුදල මාසිකව රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත මුදලින් ගෙවා පොදු 172 ලදුපතක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.
II. කිරිහල පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කරන බලධාරියා විසින් නියම කරන වාර්ෂික බලපත්‍ර ගාස්තු බදුකරු විසින් ගෙවිය යුතුය.
III. මේ සම්බන්ධයෙන් මහනුවර මහ නගර සභාවෙන් පනවා ඇති සියලුම රෙගුලාසි බදුකරු විසින් පිළිපැදිය යුතු අතර ගොඩනැගිල්ල සඳහා නියමිත විදුලිය, ජල මීටර් යනාදිය සඳහා වන ගාස්තුද කසලශෝධන ගාස්තුද ගෙවීමට බදුකරු බැඳී සිටී.
IV. තෝරා ගන්නා ලද ලංසුකරු විසින් VAT බදු, දේශීය ආදායම් කොමසාරිස්ගේ 2006 අංක 12 දරණ මුද්දර බදු (විශේෂ විධි විධාන) පනත ඇතුළු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් වරින් වර පනවනු ලබන බදු බැදියාවන්ට ද යටත්විය යුතුය.

## 16. ප්‍රමාද ගාස්තු ගෙවීම

I. සෑම මසකම 05 වන දිනට පෙර පසුගිය මාසයේ බදු මුදල ගෙවිය යුතු අතර ප්‍රමාද වන එක් දිනක් සඳහා මාසික බදු මුදලින් 0.5% ක ප්‍රමාද ගාස්තුවක් උපරිම සති 02ක කාලයක් සඳහා (දින 14) ගෙවීමට බදු කරුට සිදුවේ.
II. ඉහත 16 (i) හි සඳහන් දින ගණන ඉක්මවා බදු මුදල් ගෙවීම ප්‍රමාද වන සෑම අවස්ථාවකම ප්‍රමාද වන එක් දිනක් සඳහා මාසික බදු මුදලින් 1%ක ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතුය.
III. ඉහත බදු මුදල් ගෙවීමට නිශ්චිත දින ඉක්මවා මසකට (දින 30) වඩා ප්‍රමාද කරන බදු කරුගේ ගිවිසුම අවලංගු කර කාර්ය සාධන ඇපකරය රාජසන්තක කිරීමට හා දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති ඇපකරයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයවිය යුතු යම් මුදලක් වේනම් අයකර ගැනීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත්තේය.
IV. බදු මුදල් ගෙවීම හෝ ප්‍රමාද ගාස්තු ගෙවීම පැහැර හරින බදුකරුගේ ගිවිසුම ඕනෑම අවස්ථාවක අවලංගු කර සුදුසුයැයි හැගෙන ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාට පූර්ණ බලය ඇත්තේය.

## 17. අතුරු බදු දීම හෝ පැවරීම

I. ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සමග අත්සන් කරනු ලබන ගිවිසුම අනුව බදුකරු වෙත පැවරෙන වගකීම, බැදීම සහ වරප්‍රසාද කිසිම හේතුවක් නිසාවත් වෙනත් කෙනෙකුට පැවරීම, බදුදීම, අතුරු බදුදීම හෝ වෙනත් අන්දමකින් භාර කිරීම තහනම්ය.
II. ගිවිසුමේ මෙම වගන්තිය උල්ලංඝනය කරන බදුකරුවන්ගේ බදු ගිවිසුම අවලංගු කිරීමට හා කාර්ය සාධන ඇපකරය රාජසන්තක කිරීමට කටයුතු කරනු ලැබේ.

## 18. ගිවිසුම අවලංගු කිරීම හෝ අහෝසි කිරීම

I. ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම, බදු මුදල් නියමිත පරිදි නොගෙවීම, ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග එකගවූ මිල ගණන් වලට පටහැනි මිල ගණන් වලට ආහාර පාන අලෙවි කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගත් හා අලෙවි කිරීම තහනම් කර ඇති ආහාර පාන අලෙවි කිරීම මත මෙම බදු ගිවිසුම අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලය ඇත්තේය.

II. එසේම ගොඩනැගිල්ලේ වෙනසක් සිදු කිරිම, ගොඩනැගිල්ල තුල හෝ පිටත ආහාරපාන පිළියෙල කිරිම සඳහා මුලුතැන්ගෙයක් පවත්වාගෙන යාම, රාජකීය උද්භිද උද්‍යානයේ අලංකාරයට හා කීර්ති නාමයට හානියක් සිදුවන ආකාරයේ කිසිවක් සිදුකිරිම සපුරා තහනම් වන අතර එසේ කළ බවට අනාවරණය වුවහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ගිවිසුම අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලය ඇත්තේය.

III. මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් රාජකිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු හෝ පරීක්ෂණයක් පවත්වා අදාල චෝදනා සනාථ වුවහොත් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඩ මුදලක් ගෙවීමට බදුකරු බැඳී සිටිය යුතු අතර ඒ හේතුවෙන් ගිවිසුම අවලංගු කිරිමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලය ඇත්තේය.

IV. ගිවිසුම අවලංගු කිරීම මත රජයට අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති තැන්පතුව හා කාර්ය සාධන ඇපකරය යොදා ගැනීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේය.

V. ගිවිසුම අවලංගු කිරීම හෝ අහෝසි කිරීම මත රජයට සිදුවන පාඩුවක් අලාභයක් අයකරගැනීමට කාර්ය සාධන ඇපකරය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් යොදා ගැනීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

VI. බදුකරුගේ වරදක්, ප්‍රමාදයක් හෝ වෙනයම් බදුකරුට පාලනය කළ හැකි හේතුවක් මත ගිවිසුම අවලංගු හෝ අහෝසි වන අවස්ථාවක කාර්ය සාධන ඇපකරය සම්පූර්ණයෙන්ම රාජසන්තක කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

**19. කිරිහල විවෘත කිරීම හා වසා තැබීම සම්බන්ධ කොන්දේසි**

I. මෙම කිරිහල වර්ෂයේ දින 365/366 පුරාම විවෘතව තැබිය යුතුයි. යම් නොවැලැක්විය හැකි හේතුවක් මත කිරිහල වසා තැබීමට සිදුවුවහොත් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත දැන්වීමක් කර පූර්ව අනුමැතිය ලබාගත යුතුයි.

II. මෙම කිරිහල දිනපතා පෙ.ව 7.30 ට සිට ප.ව 5.30 දක්වා විවෘතව තැබිය යුතුයි.

III. කිරිහල සඳහා අවශ්‍ය භාණ්ඩ හා අනෙකුත් උපකරණ සැපයීම සඳහා වාහන උද්‍යාන ප්‍රධාන දොරටුව ඉදිරිපිට ගාල් කිරීමට අවසර ඇත්තේ පෙ.ව. 7.00 සිට පෙ.ව. 9.00 දක්වා හා ප.ව. 2.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල පමණි. පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා හා ප.ව. 3.00න් පසුව කිසිදු වාහනයක් උද්‍යාන ප්‍රධාන දොරටුව අසල ගාල් කිරීම සපුරා තහනම් වේ.

IV. එසේ ගාල් කිරීමට අවසර දෙනු ලබන උපරිම වාහන ගණන 3ක් වන අතර එම වාහන වල අංක, රියදුරු හා සහයක මහතුන්ගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබාදී අනුමැතිය ලබා ගත යුතුය. එසේ අවසරලත් වාහන හැර වෙනත් කිසිදු වාහනයක් උද්‍යාන ප්‍රධාන දොරටුව අසල ගාල් කිරීමට අවසර දෙනු නොලැබේ.

V. වෙළඳ නියෝජිත මහතුන්ගේ වාහනද ඉහත වේලාව තුළ පමණක් උද්‍යාන ප්‍රධාන දොරටුව අසල ගාල් කර භාණ්ඩ කිරිහල වෙත ලබාගත හැකි අතර ඒ සඳහා පූර්ව අනුමැතිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වන්නේය.

**20. කිරිහලේ අලෙවි කරන ආහාර පාන සම්බන්ධ කොන්දේසි**

I. මෙම කිරිහලෙහි අලෙවි කරන සියලුම භාණ්ඩ පිළිබදව උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

II. ලංසුකරු විසින් ඇසුරුම් කරගත් ආහාරපාන (අයිස්ක්‍රීම්, යෝගට්, බෝතල් කරන ලද බීම වර්ග, යනාදිය) ලබා ගෙන අලෙවි කිරීමේදී ඒවා ප්‍රමිති සහතිකය සහිත පිළිගත් නිෂ්පාදකයින් විසින් නිපදවන ලද ඒවා බවට වග බලා ගත යුතුය. මෙම ආහාර පාන ඒවායේ සඳහන් කර ඇති මිලට අලෙවි කල යුතුය. එම ආහාර කාලය ඉකුත් නොවූ ඒවා විය යුතුය.

III. කිරිහලෙහි ශීතකරණ වලට යොදන ජලය ඇතුලු පාවිච්චියට ගන්නා සියලුම ජලය ඉතා පිරිසිදු පෙරාගත් ඒවා විය යුතුය.

IV. මෙම කිරිහලෙහි මත්පැන්, දුම්වැටි හෝ මත්ද්‍රව්‍ය අලෙවියට සහ භාවිතයට අවසර නැති අතර එය සපුරා තහනම්ය.

**21. යොදවන සේවකයින් පිලිබද කොන්දේසි**

I. බදුකරු විසින් එහි සේවකයින්ට නිල ඇඳුම් සැපයිය යුතු අතර එම සේවකයින් ඒවා පිරිසිදුව පළඳින බවට වග බලා ගත යුතුය.

II. ආහාරපාන සැපයීමේදී සේවකයින් හිස්වැසුම් හා අත්වැසුම් පැළඳීම අනිවාර්ය වේ.

III. තවද වරින් වර රජය විසින් නිකුත් කරන සෞඛ්‍ය, ආරක්ෂක හා වෙනත් මාර්ගෝපදේශයන්ට අනුකූලව සේවකයින් සේවයේ යෙදවීමට බදුකරු විසින් කටයුතු කළ යුතුය

IV. සේවයේ යොදවන සේවකයින්ගේ නාම ලේඛනයක් හා ජාතික හැදුනුම්පත් වල ඡායා පිටපත් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබාදිය යුතුය.

V. සේවකයින්ට හා සෙසු කාර්ය මණ්ඩලයට පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා කිරිහලේ රැඳී සිටීමට අවසර ඇත්තේය.

VI. යම් අත්‍යවශ්‍ය හේතුවක් මත ඉහත 21(V) හි වේලාවෙන් පරිබාහිරව රැදී සිටින්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මඟින් ලබාගත යුතුය.

VII. කිසියම් අවස්ථාවක ප්‍රමාණවත් හේතූන් මත යම්කිසි පුද්ගලයකු සේවයේ නොයෙදවිය යුතුයැයි ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් බදුකරු වෙත ලිඛිතව දැනුම් දීමක් කළහොත් බදුකරු විසින් එසේ සඳහන් කරනු ලැබූ අය සේවයේ නොයෙදවිය යුතුය.

VIII. යොදවන සේවකයින්ට පඩිපාලක සභා හා කම්කරු ආඥා පනත යටතේ නියම කරඇති අවම වේතන ගෙවීමත් සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල සඳහා නිසි පරිදි දායක මුදල් අදාල ගිණුම් වලට බැර කිරීමටත් බදුකරු කටයුතු කළ යුතුය.

## 22. හානි හා පාඩු සම්බන්ධ අයකිරීම

I. බදුකරු ඔහුගේ සේවකයින්ගේ නොසැලකිල්ල නිසා කිරිහල පිහිටි ගොඩනැගිල්ලට සිදුවන අලාභ හානි සම්බන්ධව බදුකරු වගකිව යුතුය.

II. මෙම ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියාවන් හා සවිකිරීම් සිදුකිරීම ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලබන අතර බදුකරුට ගොඩනැගිල්ලේ කිසිදු වෙනස් කිරීමක් කිරීමට බලය නැත්තේය. තවද රු.25,000/-ට අඩු සියලු සුළු අලුත්වැඩියාවන් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ අනුමැතිය මත බදුකරු විසින් සිදු කර ගත යුතුය.

## 23. කිරිහල පවත්වාගෙන යාමේ වෙනත් කොන්දේසි

I. රාජකීය උද්භිද උද්‍යානයේ කාර්ය මණ්ඩලයට හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට සහන මිලට ආහාර පාන සැපයිය යුතු අතර ලංසු ලියවිලි සමග ආකෘති අංක 2 හා 3 මගින් එම මිල ගණන් පැහැදිලිව වෙන් වෙන්ව ඉදිරිපත් කල යුතුය.

II. කැසට් යන්ත්‍ර, ගුවන් විදුලි, රූපවාහිනී ආදී සියලු ශබ්දවාහිනි වල හඬ කිරිහල පවතින පරිශ්‍රයට පමණක් සීමා විය යුතුය.

III. ලංසුකරු විසින් ගෙන එනු ලබන උපකරණ ගෘහභාණ්ඩ කිසිවක් වේ නම් ඒවා පිළිබඳව ලැයිස්තුවක් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

IV. බදුකරු කිරිහලෙහි ගොඩනැගිල්ල, ආලින්දය, ගෘහ භාණ්ඩ සහ ඒ අවට භූමි භාගය දිනපතා විෂබීජ නාෂක යොදා පිරිසිදුව තබා ගත යුතු අතර පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

V. කිරිහලෙහි ආහාර සහ එහි ගෘහ භාණ්ඩ යනාදිය මැස්සන් සහ මීයන්ගෙන්ද වෙනත් කෘමි සතුන්ගෙන්ද තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලුම සෞඛ්‍ය විදි අනුගමනය කල යුතු අතර සෞඛ්‍ය අධිකාරි විසින් දී ඇති උපදෙස් හා වරින් වර රජය විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

VI. කිරිහලෙහි ඉතිරිවන ආහාරපාන සහ කැලිකසල යනාදිය දිනපතා ඉවත් කිරීමට බදුකරු කටයුතු කළ යුතුය. මේ සඳහා මහනුවර මහ නගර සභාවේ උපදෙස් මත සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. මෙසේ කටයුතු කිරීමට බදුකරු අපොහොසත් වුවහොත් මසක කල්දීමකින් යුතුව බදු ගිවිසුම අවසන් කොට කාර්ය සාධන ඇපකරය රාජ සන්තක කිරීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

VII. කිරිහලේ වැසිකිලි පහසුකම් උසස් අන්දමින් පවත්වා ගැනීම පිණිස අවශ්‍ය කරන භාණ්ඩ ලංසුකරු විසින් සපයා ගත යුතු අතර පවිත්‍රතා සේවා නිසි පරිදි පවත්වාගත යුතුය.

VIII. සංචාරකයින් උනන්දුවක් දක්වන ශ්‍රී ලංකා අත්කම්, විසිතුරු භාණ්ඩ, ප්‍රකාශන, අත්‍යවශ්‍ය සෞඛ්‍ය හා සනීපාරක්ෂක භාණ්ඩ ආදිය ආපන ශාලාව තුළ අලෙවි කළ හැක. නමුත් ඒ සඳහා දෙපාර්තමේන්තු නාමය හෝ නිල සලකුණ භාවිතය සපුරා තහනම් වේ. එසේ භාණ්ඩ අලෙවි කිරීමට අදහස් කරන්නේ නම් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුයි. එම භාණ්ඩ අලෙවි කළ යුත්තේ නිෂ්පාදකයා සඳහන් කළ මිලට පමණි.

IX. නමුත් ස්වර්ණාභරණ, මැණික්, රෙදිපිළි හෝ වෙනත් සාප්පු භාණ්ඩ විකිණීම සපුරා තහනම්ය.

X. එයට අමතරව ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කිරිහල පවත්වාගෙන යාම සම්බන්ධව වරින්වර පනවනු ලබන නීතිරීති රෙගුලාසි හා උපදෙස් අනුව කටයුතු කිරීමටද බදුකරු බැඳී සිටී.

24. **කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ තීරණය සම්බන්ධයෙන් සියලුම ලංසුකරුවන් ලංසු ප්‍රධානයට පෙර දැනුම්දෙනු ලබන අතර අතෘප්තියට පත් යම් අසාර්ථක වූ ලංසුකරුවෙක් වේ නම් සාර්ථක ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ තීරණයට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5 ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත රු.10,000.00 ක නැවත නොගෙවන මුදලක් ගෙවා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පොදු 172 වවුචර්යක් ලබා අභියාචනයක් ලබා දෙන කාළ සීමාව තුල ඉදිරිපත් කල හැක.**

ඉහත සදහන් කොන්දේසි වලින් බැදී සිටීමට මම එකග වෙමි.

...........................................
ලංසුකරුගේ අත්සන
(රබර් මුද්‍රාව)

දිනය :- ...............................................

ලංසුකරුගේ නම සහ ලිපිනය :-
.........................................................................................................................
.........................................................................................................................
.........................................................................................................................
දුරකථන අංකය :- නිවස :- .........................................................................
ජංගම දුරකථනය :- ..........................................................
ජාතික හැදුනුම්පත් අංකය :- .................................................................................... (පිටපතක් අමුණන්න)

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
# පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහසාධක ආපනශාලාව බදු දීම - 2025/2026
# ලංසු කොන්දේසි පත්‍රය

**1.හැඳින්වීම**

I. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පිහිටි සුහසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා තෝරා ගන්නා ලංසුකරුහට සුහසාධක ආපනශාලාව පිහිටි ගොඩනැගිල්ල පමණක් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා භාර දෙනු ලැබේ.

II. මෙහි මූලික අරමුණ උද්‍යානයේ කාර්ය මණ්ඩලයට ආහාරපාන සැපයීම වන අතර උද්භිද උද්‍යානය නැරඹීමට එන සංචාරකයින්ටද ආහාරපාන සැපයීමටද බදුකරුට හැකියාව ඇත.

III. ඒ හැරුනු කොට විශේෂ භෝජන සංග්‍රහ පැවැත්වීමට අවශ්‍ය වන්නේනම් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මඟින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය.

IV. එවැනි විශේෂ අවස්ථා සඳහා පැමිණෙන අමුත්තන් උද්භිද උද්‍යානයට ඇතුල්වීමේදී ඇතුල්වීමේ ගාස්තුව ගෙවිය යුතුය.

V. උද්භිද උද්‍යානයේ පාලන කටයුතු වලට අවහිර නොවන අන්දමින් මෙවැනි විශේෂ භෝජන සංග්‍රහ පැවැත්වීමට කටයුතු කිරීම බදුකරුගේ වගකීමක් වන අතර මංගල සාද පැවැත්වීම සපුරා තහනම් වේ.

**2.ලංසු ඉදිරිපත් කිරීමට ඇති සුදුසුකම්**

I. ලංසුකරු ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචි වී තිබිය යුතු අතර එය සනාථ කිරීම සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ පිටපතක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුයි. සමාගම් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරන්නේ නම් සාංගමික සංස්ථාවලියේ පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

II. ලංසු මිල ගණන් පත්‍රය සමග, ලංසු කොන්දේසි පත්‍රය, ආකෘති අංක 1,2,3,4 හා 5ද ව්‍යාපාරය නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමේ 2025 වර්ෂයේ ආසන්න අනුයාත මාස 3ක බැංකු ප්‍රකාශන වල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. මීට පෙර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් ගතවී ගිවිසුම් කඩකර ඇති හෝ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග නීති මගින් කටයුතු කරන අයකුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයකුට මෙම ලංසු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට අයිතිවාසිකම් නැත්තේය.

**3.පළපුරුද්ද**

**I.** ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන ලංසුකරු විසින් උසස් අන්දමින් ආහාර සැපයීම සම්බන්ධයෙන් හා මෙවැනි ආපනශාලාවක් පවත්වාගෙන යාම පිළිබඳ අඩුම වශයෙන් අවුරුදු 01කවත් සතුටුදායක පළපුරුද්දක් හෝ වෘත්තීය පුහුණුවක් හෝ අධ්‍යාපනයක් ලබා තිබීම ඇගයීමට භාජනය කරනු ලැබේ. ඒ බව සනාථ කිරීම සඳහා පුහුණු සහතික හා ආකෘති අංක 4 සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

**II.** නිශ්චිත ස්ථානයක මේවන විටත් ආපනශාලාවක් හෝ හෝටලයක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකුවීම ඇගයීමේදී සලකා බලනු ලැබේ.

**III.** කාර්ය මණ්ඩලය 300කට අධික ප්‍රමාණයක් සිටින මෙම ස්ථානයේ ඔවුනට උසස් සේවාවක් අඛණ්ඩව සැපයීමේ හැකියාව ඇති බව සනාථ කිරීම සඳහා අංක 4 ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කිරීම ඇගයීමට භාජනය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පළපුරුද්දක් නොමැති වුවද ආකෘති අංක 4 හිස් වාර්තාවක් ලෙස අත්සන්, දින, නිල මුද්‍රා තබා ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති ලංසුපත් අසම්පූර්ණ ලංසු පත් ලෙස සලකා ඇගයීමට භාජනය කරනු නොලැබේ.

IV. නිශ්චිත ස්ථානයක මේවන විටත් මෙවැනි සුහසාධක ආපනශාලාවක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයකු වීම ඇගයීමේදී සලකා බලනු ලැබේ.

**4.ලංසු සුරක්ෂණය**

I. ලංසුකරු ලංසු ලියවිලි සමග රු.10,000/-ක් (රුපියල් දස දහසක්) වටිනා ලංසු ඇපකරයක් 2025.07.30 දින දක්වා වලංගු කොන්දේසි විරහිත බැංකු ඇප බැඳුම්කරයක් රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුභසාධක ආපනශාලාව බදුදීම සඳහා ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

II. එසේ නොමැති නම් මුදලින් රු.10,000/-ක් (රුපියල් දස දහසක්) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ලබාගන්නා පොදු 172 ලදුපතේ මුල් පිටපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

III. චෙක්පත් හෝ බැංකු අණකර **භාරගනු නොලැබේ**. වලංගු ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොමැති ලංසු ඇගයීමට භාජනය නොකෙරේ.

**5.මිල ගණන් පත්‍රය**

I. රාජකීය උද්භිද උද්‍යානයේ සුභසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා තෝරා ගන්නා ලද ලංසුකරු විසින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත මසකට රු. 44,000/-කට (රුපියල් හතලිස් හතර දහසකට) නොඅඩු වැට් රහිත බදු මුදලක් සහ ඊට අදාලව රජය විසින් පනවා ඇති අනුපාත යටතේ (18%) වැට් බදු (VAT) මුදලද මාසිකව ගෙවිය යුතුය.

II. ලංසුකරු ඉදිරිපත් කරනු ලබන ලංසු පිටපත් දෙකෙහිම ලංසු කරනු ලැබූ මුදල අකුරින්ද ඉලක්කමින්ද සඳහන් කල යුතුය. අකුරින් සඳහන් කළ මුදලට වෙනස් මුදලක් ඉලක්කමින් සඳහන් කර ඇති විටකදී හෝ යම් මුදලක් ඉලක්කමින් හෝ අකුරින් හෝ පමණක් සඳහන් කර ඇති විටකදී හෝ ලංසුව ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

III. ලංසුකරු විසින් ලංසු ලියවිලි පැහැදිලි අත් අකුරින් නියමිත පරිදි අත්සන්, දින, නිල මුද්‍රා යොදා ඉදිරිපත් කළ යුතු අතර යමක් සංශෝධනය කිරීමට අවශ්‍ය නම් තනි ඉරකින් කපා කෙටි අත්සන් යෙදීම කළ යුතුය. එසේ නොමැතිව ටිපෙක්ස් කර, මකා හෝ කටුගා ඇති විටකදී ලංසුව ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

IV. ලංසු පත්‍රය සමග ඉදිරිපත් කර ඇති ආකෘති අංක 2 අනුව ආහාර පාන මිල ගණන් ලැයිස්තුවද නියමිත අත්සන්, දින හා මුද්‍රා තබා ඉදිරිපත් කිරීම **අනිවාර්යය වේ**. ආකෘති පත්‍රයේ අඩංගු සියලුම ආහාර පාන සඳහා මිල ගණන් සම්මත බර සමග ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ලංසු ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

V. ආකෘති අංක 2හි සඳහන් කර නොමැති අමතර ආහාර පාන කිසිවක් අලෙවි කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ආකෘති අංක 3 අනුව සම්මත බර සමග මිල ගණන් ඉදිරිපත් කළ හැක. එසේ අමතර ආහාර පාන කිසිවක් අලෙවි කිරීමට බලාපොරොත්තු නොවන්නේ නම් අකෘති අංක 3 හිස් වාර්තාවක් ලෙස නියමිත අත්සන්, දින හා නිල මුද්‍රා තබා ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. ආකෘති අංක 3 මඟින් අමතර ආහාර පාන සඳහා මිල ගණන් ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු අතර පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.ආකෘති අංක 3 හිස් වාර්ථාවක් වීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොවන්නේය.

VI. ලංසු ප්‍රදානය කිරීමෙන් පසු බදුකරු විසින් ආපනශාලාවේ අලෙවි කිරීමට බලාපොරොත්තු වන සියලුම ආහාර පාන සහ වෙනත් ද්‍රව්‍ය වල සම්පූර්ණ විස්තරයක් සහ ඒවායේ මිල ගණන් ලැයිස්තුවක් සුභසාධක ආපනශාලාව ඉදිරිපිට මහජනතාවට දර්ශනය වන අයුරින් ප්‍රදර්ශනය කර තැබිය යුතුය.

**6. ලංසුව සමග ඉදිරිපත් කළ යුතු පහත ලේඛණ ලංසු ලේඛණයේ අනුපිළිවෙලින් අමුණා ඉදිරිපත් කළ යුතුය.**

I. ලංසු මිල ගණන් පත්‍රය(ආකෘති අංක 1)
II. ලංසු සුරක්ෂණය
III. ව්‍යාපාර නාම ලියාපදංචි සහතිකයේ ඡායා පිටපත (සමාගමක් නම් සමාගම් ලියාපදිංචිය සමඟ සාංගමික සංස්ථාපත්‍රයේ ඡායා පිටපතක්ද ඉදිරිපත් කළ යුතුයි)
IV. ලංසුකරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත
V. ආහාර පාන මිල ගණන් පත්‍රය (ආකෘති අංක 2)
VI. අමතර ආහාර පාන මිල ගණන් පත්‍රය (ආකෘති අංක 3)
VII. පළපුරුද්ද පිළිබඳ ආකෘති පත්‍රය (ආකෘති අංක 4)
VIII. සමාන ව්‍යාපාර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාල පළාත් පාලන ආයතනයෙන් තහවුරු ලේඛණ
IX. අත්සන් කරන ලද ලංසු කොන්දේසි පත්‍රය
X. පසුගිය අනුයාත ආසන්න මාස 3ක බැංකු ප්‍රකාශන වල පිටපත්
XI. පිරික්සුම් ලැයිස්තුව (ආකෘති අංක 5)
XII. දිවුරුම් ප්‍රකාශය

**7.ලංසු ඉදිරිපත් කිරීම**

I. පුවත්පත් දැන්වීමේ සඳහන් පරිදි ලංසු ආකෘති හා අනෙකුත් විස්තර ලබා ගැනීම පිණිස ආපසු නොගෙවන රු.3,000.00ක මුදලක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලදුපත ඉදිරිපත් කර ලංසු ආකෘති ලබාගත යුතුය.

II. ලංසු කොන්දේසි පත්‍රය ඇතුළු ආකෘති අංක 1,2,3,4,5 එම ආකෘති වලම සම්පූර්ණ කර නියමිත පරිදි අත්සන්, දින , නිලමුද්‍රා තබා ඉදිරිපත් කිරීම **අනිවාර්යය වන අතර ලංසු ඉදිරිපත් කිරීම ලංසු කොන්දේසි පත්‍රයේ සියලුම කොන්දේසි වලට ලංසුකරු එකඟවූ බවට සලකනු ලැබේ.**

III. එම ලංසු ආකෘති මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් 2කින් ඉදිරිපත් කළ යුතු අතර මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවර 2ක බහා මුද්‍රා තැබිය යුතු අතර එම කවර වල ලංසුකරුගේ නම, ලිපිනය, මුල් පිටපතද අනු පිටපතද යන වග පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

IV. එම කවර 2 කම එකම කවරයක බහා මුද්‍රා තබා ලංසුකරුගේ නම හා ලිපිනය එම කවරයේ සඳහන් කළ යුතු අතර එහි වම්පස ඉහළ කෙලවරේ "පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහසාධක ආපනශාලාව බදු දීම-2025/2026" ලෙස සඳහන් කළ යුතුය.

V. ලංසුපත් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපතිවරයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පේරාදෙණියේ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි නිළ කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර බහාලිය යුතුය.

VI. ලංසු භාරගැනීම අවසන් වූ වහාම 2025.04.30 දින පෙ.ව.11.00ට ලංසු විවෘත කරනු ලැබේ.

**8.ලංසු ඉවත් කර ගැනීම**

I. ඉදිරිපත් කළ ලංසුවක් ඉවත් කර ගැනීමට අවශ්‍ය නම් 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැන්විය යුතුය. එම දැන්වීම 2025.04.30 දින පෙ.ව.11.00ට පෙර පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි නිළ කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.

II. ලංසු විවෘත කළපසු ඉදිරිපත් කළ කිසිදු ලංසුවක් ඉවත් කරගැනීමට නොහැකි අතර ඉදිරිපත් කළ ලංසුව 2025.07.30 දින දක්වා වලංගු විය යුතුය. ලංසු විවෘත කිරීමෙන් පසු ලංසු ඉවත් කර ගන්නා බවට ලැබෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන අතර ලංසු සුරක්ෂණය රාජ සන්තක කිරීමට කටයුතු කර අසාදුගත සැපයුම්කරුවන්ගේ ලේඛණයට එම ලංසුකරු ඇතුලත් කරනු ලැබේ.

**9.ලංසු විවෘත කිරීම**

I. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 2025.04.30 දින පෙ.ව.11.00ට පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේදි ලංසු විවෘත කරනු ලැබේ.

II. මේ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ එක් නියෝජිතයෙකුට සහභාගී වීමට හැක.

III. ඉදිරිපත් වී ඇති ලංසු මිල ගණන් එම අවස්ථාවේදී ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ප්‍රකාශයට පත් කරනු ඇත.

**10. ලංසු වල වලංගුභාවය**

I. ලංසු විවෘත කළ දින සිට දින 90ක් දක්වා ලංසුව වලංගු විය යුතුය.

**II.** ඉදිරිපත් කළ මිල ගණන් ස්ථාවර විය යුතු අතර නැවත මිල සංශෝධනය කර ඉල්ලීම් ඉදිරිපත් නොකළ යුතුය.

**III.** එවැනි ඉල්ලීම් ඇගයීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසුවද ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ලංසු විවෘත කිරීමෙන් පසු මිල සංශෝධනය කරනු ලබන ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂණය රාජ සන්තක කරනු ලැබේ.

**11. ලංසු භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම**

I. සම්පූර්ණ ලංසුවම හෝ ලංසුවෙන් කොටසක් භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිට අයිතිය ඇත්තේය.

II. මෙම දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක/ආයතනයක මෙවැනි සුහසාධක ආපනශාලාවක් හෝ ආපන ශාලාවක් පවත්වාගෙන ගොස් කොන්දේසි කඩ කරන ලද හෝ රජයට කළයුතු ගෙවීම් පැහැර හරින ලද හෝ වෙනත් මොනයම් හෝ දූෂණයක් / වංචාවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ වරදකරු වී සිටින ආයතන හෝ පුද්ගලයින් ඉදිරිපත් කරනු ලබන ලංසුපත් ප්‍රතික්ෂේප කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත්තේය.

**12. කාර්ය සාධන ඇපකරය**

I. සිය ලංසුව පිළිගෙන තිබෙන බවට වූ ලිඛිත දැන්වීම ලැබී වැඩ කරන දින 10ක් ඇතුලත අදාල ලංසුකරු විසින් කාර්යසාධන ඇපකරයක් වශයෙන් මාසික බදු මුදලමෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මුදලින් තැන්පත් කිරීම හෝ රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් බදු කාලසීමාවෙන් ඔබ්බට දින 28ක් දක්වා වලංගු අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහසාධක ආපනශාලාව බදුදීම සඳහා කාර්ය සාධන ඇපකරයක් ඉදිරිපත් කල යුතුය.

II. එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කලහොත් හෝ ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දුන් විට නොපැමිණිය හොත් හෝ තමා සමග ගිවිසුමකට ඇතුලත්වන ලෙස දැන්වූ විට නොපැමිණිය හොත් හෝ සුහසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තමන්ට සුදුසු යයි හැඟෙන වෙනත් විකල්ප විධිවිධාන යෙදීමේ පූර්ණ අයිතිය ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

III. ලංසුකරු විසින් කොන්දේසි කඩකිරීම හේතුවෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට කිසියම් අලාභයක් සිදුවුවහොත් එයද ලංසුකරුගෙන් අයකරනු ලැබේ. එවැනි අවස්ථාවලදී ලංසුකරු විසින් මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් තබා ඇති ඇප මුදල් රාජ සන්තක කරන අතර ඔහුගේ නම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අසාදුගත ලංසුකරුවන්ගේ ලේඛණයට ඇතුලත් කරනු ලැබේ.

**13. ගිවිසුම් අත්සන් කිරීම**

I. තෝරාගත් බදුකරු ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමක් අත්සන් කල යුතු අතර එම ගිවිසුම එක් මසක දැනුම් දීමක් ඇතිව ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ටද, තුන්මසක දැනුම්දීමක් ඇතිව බදුකරුටද අවලංගු කිරීමට ක්‍රියාකල හැකිය.

II. ගිවිසුම අවලංගු වන දින ලංසුකරු ශ්‍රී ලංකා ජනරජයේ දේපල ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට හෝ නිසි පරිදි භාර දී අදාල වෙළඳ සැලෙන් ඉවත්විය යුතුය.

**14. ගිවිසුමේ වලංගු කාලය**

I. තෝරාගත් ලංසුකරු බදු මුදල් නිසි පරිදි ගෙවමින් උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන ආකාරයට සුහසාධක ආපනශාලාව පවත්වා ගෙන යන්නේ නම් වර්ෂයක ගිවිසුම් කාලයකට පවත්වා ගෙන යාමට ඉඩ දෙනු ලැබේ.

**15. බදු මුදල් ගෙවීම**

I. සුහසාධක ආපනශාලාවට ආහාරපාන සැපයීමේ අයිතිය ලබාදීම වෙනුවෙන් තෝරාගන්නා ලද බදුකරු විසින් ගිවිසුම් ප්‍රකාරව එකගව වූ බදු මුදල මාසිකව රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත මුදලින් ගෙවා පොදු 172 ලදුපතක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

II. සුහසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කරන බලධාරියා විසින් නියම කරන වාර්ෂික බලපත්‍ර ගාස්තු බදුකරු විසින් ගෙවිය යුතුය.

III. මේ සම්බන්ධයෙන් මහනුවර මහ නගර සභාවෙන් පනවා ඇති සියලුම රෙගුලාසි බදුකරු විසින් පිළිපැදිය යුතු අතර ගොඩනැගිල්ල සඳහා නියමිත විදුලිය, ජල මීටර් යනාදිය සඳහා වන ගාස්තුද කසලශෝධන ගාස්තුද ගෙවීමට බදුකරු බැඳී සිටී.

IV. තෝරා ගන්නා ලද ලංසුකරු විසින් VAT බදු, දේශීය ආදායම් කොමසාරිස්ගේ 2006 අංක 12 දරණ මුද්දර බදු (විශේෂ විධි විධාන) පනත ඇතුළු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් වරින් වර පනවනු ලබන බදු බැදියාවන්ට ද යටත්විය යුතුය.

**16. ප්‍රමාද ගාස්තු ගෙවීම**

I. සෑම මසකම 05 වන දිනට පෙර පසුගිය මාසයේ බදු මුදල ගෙවිය යුතු අතර ප්‍රමාද වන එක් දිනක් සඳහා මාසික බදු මුදලින් 0.5% ක ප්‍රමාද ගාස්තුවක් උපරිම සති 01ක කාලයක් සඳහා (දින 7) ගෙවීමට බදු කරුට සිදුවේ.

II. ඉහත 16 (i) හි සඳහන් දින ගණන ඉක්මවා සතියකට වඩා (දින 7) ප්‍රමාද කරන බදුකරුගේ ගිවිසුම අවලංගු කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත්තේය.

III. බදු මුදල් ගෙවීම හෝ ප්‍රමාද ගාස්තු ගෙවීම පැහැර හරින බදුකරුගේ ගිවිසුම ඕනෑම අවස්ථාවක අවලංගු කර සුදුසුයැයි හැගෙන ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාට පූර්ණ බලය ඇත්තේය.

**17. අතුරු බදු දීම හෝ පැවරීම**

I. ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් සමග අත්සන් කරනු ලබන ගිවිසුම අනුව බදුකරු වෙත පැවරෙන වගකීම, බැදීම සහ වරප්‍රසාද කිසිම හේතුවක් නිසාවත් වෙනත් කෙනෙකුට පැවරීම, බදුදීම, අතුරු බදුදීම හෝ වෙනත් අන්දමකින් භාර කිරීම තහනම්ය.

II. මෙම ගිවිසුම යටතේ පැවරෙන කටයුතු ඉටුකිරීම සඳහා බදුකරු විසින් ශ්‍රී ලංකා ජනරජයේ කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම ඇතුලත් අයකුට හෝ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකික පුරවැසිභාවය ලබා නොගත් අයකුට හෝ ඇටෝර්නි බලය නිකුත් නොකල යුතුය.

III. ගිවිසුමේ මෙම වගන්තිය උල්ලංඝනය කරන බදුකරුවන්ගේ බදු ගිවිසුම අවලංගු කිරිමට හා කාර්ය සාධන ඇපකරය රාජසන්තක කිරිමට කටයුතු කරනු ලැබේ.

**18. ගිවිසුම අවලංගු කිරීම හෝ අහෝසි කිරීම**

I. ගිවිසුමේ කොන්දේසි කඩ කිරිම, බදු මුදල් නියමිත පරිදි නොගෙවීම, ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග එකගවූ මිල ගණන් වලට පටහැනි මිල ගණන් වලට ආහාර පාන අලෙවි කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා නොගත් හා අලෙවි කිරීම තහනම් කර ඇති ආහාර පාන අලෙවි කිරීම මත මෙම බදු ගිවිසුම අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලය ඇත්තේය.

II. එසේම ගොඩනැගිල්ලේ වෙනසක් සිදු කිරිම, ගොඩනැගිල්ල තුල හෝ පිටත ආහාරපාන පිළියෙල කිරිම සඳහා මුලුතැන්ගෙයක් පවත්වාගෙන යාම, රාජකීය උද්භිද උද්‍යානයේ අලංකාරයට හා කීර්ති නාමයට හානියක් සිදුවන ආකාරයේ කිසිවක් සිදුකිරිම සපුරා තහනම් වන අතර එසේ කළ බවට අනාවරණය වුවහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ගිවිසුම අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලට ඇත්තේය.

III. මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් රාජකිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙකු හෝ පරීක්ෂණයක් පවත්වා අදාල චෝදනා සනාථ වුවහොත් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඩ මුදලක් ගෙවීමට බදුකරු බැදී සිටිය යුතු අතර ඒ හේතුවෙන් ගිවිසුම අවලංගු කිරිමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාට පූර්ණ බලය ඇත්තේය.

IV. ගිවිසුම අවලංගු කිරීම මත රජයට අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති තැන්පතුව හා කාර්ය සාධන ඇපකරය යොදා ගැනීමට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේය.

V. ගිවිසුම අවලංගු කිරීම හෝ අහෝසි කිරීම මත රජයට සිදුවන පාඩුවක් අලාභයක් අයකරගැනීමට කාර්ය සාධන ඇපකරය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් යොදා ගැනීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

VI. බදුකරුගේ වරදක්, ප්‍රමාදයක් හෝ වෙනයම් බදුකරුට පාලනය කළ හැකි හේතුවක් මත ගිවිසුම අවලංගු හෝ අහෝසි වන අවස්ථාවක කාර්ය සාධන ඇපකරය සම්පූර්ණයෙන්ම රාජසන්තක කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

**19. සුභසාධක ආපනශාලාව විවෘත කිරීම හා වසා තැබීම සම්බන්ධ කොන්දේසි**

I. මෙම සුභසාධක ආපනශාලාව වර්ෂයේ දින 365/366 පුරාම විවෘතව තැබිය යුතුයි. යම් නොවැලැක්විය හැකි හේතුවක් මත සුභසාධක ආපනශාලාව වසා තැබීමට සිදුවුවහොත් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත දැන්වීමක් කර පූර්ව අනුමැතිය ලබාගත යුතුයි.

II. මෙම සුභසාධක ආපනශාලාව දිනපතා පෙ.ව 7.30 ට සිට ප.ව 5.30 දක්වා විවෘතව තැබිය යුතුයි.

III. සුභසාධක ආපනශාලාව සඳහා අවශ්‍ය භාණ්ඩ හා අනෙකුත් උපකරණ සැපයීම සඳහා වාහන උද්‍යාන භූමිය තුලට ඇතුල් කිරීමට අවසර ඇත්තේ පෙ.ව. 7.00 සිට පෙ.ව. 10.00 දක්වා හා ප.ව. 2.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල පමණි. පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා හා ප.ව. 3.00න් පසුව කිසිදු වාහනයක් උද්‍යාන භූමියට ඇතුල්කිරීම සපුරා තහනම් වේ.

IV. එසේ ඇතුල් කිරීමට අවසර දෙනු ලබන උපරිම වාහන ගණන 3ක් වන අතර එම වාහන වල අංක, රියදුරු හා සහයක මහතුන්ගේ නම් හා ජාතික හැදුනුම්පත් අංක රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබාදී අනුමැතිය ලබා ගත යුතුය. එසේ අවසරලත් වාහන හැර වෙනත් කිසිදු වාහනයක් උද්‍යාන භූමියට ඇතුල් කිරීමට අවසර දෙනු නොලැබේ.

V. වෙළඳ නියෝජිත මහතුන්ගේ වාහන උද්‍යාන භූමියට ඇතුල්කිරීම සපුරා තහනම් වන අතර එසේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන ඇතුල් කිරීමට සිදුවන්නේනම් ඒ සඳහා පූර්ව අනුමැතිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වන්නේය.

## 20. සුහසාධක ආපනශාලාවේ අලෙවි කරන ආහාර පාන සම්බන්ධ කොන්දේසි

I. මෙම සුහසාධක ආපනශාලාවෙහි අලෙවි කරන සියලුම භාණ්ඩ පිළිබඳව උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

II. ලංසුකරු විසින් ඇසුරුම් කරගත් ආහාරපාන (අයිස්ක්‍රීම්, යෝගට්, බෝතල් කරන ලද බීම වර්ග, යනාදිය) ලබා ගෙන අලෙවි කිරීමේදී ඒවා ප්‍රමිති සහතිකය සහිත පිළිගත් නිෂ්පාදකයින් විසින් නිපදවන ලද ඒවා බවට වග බලා ගත යුතුය. මෙම ආහාර පාන ඒවායේ සඳහන් කර ඇති මිලට අලෙවි කල යුතුය. එම ආහාර කාලය ඉකුත් නොවූ ඒවා විය යුතුය.

III. සුහසාධක ආපනශාලාවෙහි ශීතකරණ වලට යොදන ජලය ඇතුලු පාවිච්චියට ගන්නා සියලුම ජලය ඉතා පිරිසිදු පෙරාගත් ඒවා විය යුතුය.

IV. මෙම සුහසාධක ආපනශාලාවෙහි මත්පැන්, දුම්වැටි හෝ මත්ද්‍රව්‍ය අලෙවියට සහ භාවිතයට අවසර නැති අතර එය **සපුරා තහනම්ය**.

## 21. යොදවන සේවකයින් පිලිබඳ කොන්දේසි

I. බදුකරු විසින් එහි සේවකයින්ට නිල ඇඳුම් සැපයිය යුතු අතර එම සේවකයින් ඒවා පිරිසිදුව පළඳින බවට වග බලා ගත යුතුය.

II. ආහාරපාන සැපයීමේදී සේවකයින් හිස්වැසුම් හා අත්වැසුම් පැළඳීම අනිවාර්ය වේ.

III. තවද වරින් වර රජය විසින් නිකුත් කරන සෞඛ්‍ය, ආරක්ෂක හා වෙනත් මාර්ගෝපදේශයන්ට අනුකූලව සේවකයින් සේවයේ යෙදවීමට බදුකරු විසින් කටයුතු කළ යුතුය

IV. සේවයේ යොදවන සේවකයින්ගේ නාම ලේඛනයක් හා ජාතික හැඳුනුම්පත් වල ඡායා පිටපත් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබාදී ඇතුල්වීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. මෙම අවසර පත්‍රය උද්‍යානයට ඇතුල්වීම සඳහා පමණක් වන අතර සුහසාධක ආපනශාලාවෙන් පිටත රැඳී සිටීමට මෙමගින් අවසර නොලැබේ.

V. සේවකයින්ට හා සෙසු කාර්ය මණ්ඩලයට පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා සුහසාධක ආපනශාලාවෙහි රැඳී සිටීමට අවසර ඇත්තේය.

VI. යම් අත්‍යවශ්‍ය හේතුවක් මත ඉහත 21(V) හි වේලාවෙන් පරිබාහිරව රැඳී සිටින්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මඟින් ලබාගත යුතුය.

VII. කිසියම් අවස්ථාවක ප්‍රමාණවත් හේතුන් මත යම්කිසි පුද්ගලයකු සේවයේ නොයෙදවිය යුතුයැයි ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් බදුකරු වෙත ලිඛිතව දැනුම් දීමක් කළහොත් බදුකරු විසින් එසේ සඳහන් කරනු ලැබූ අය සේවයේ නොයෙදවිය යුතුය.

VIII. යොදවන සේවකයින්ට පඩිපාලක සභා හා කම්කරු ආඥා පනත යටතේ නියම කරඇති අවම වේතන ගෙවීමත් සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල සඳහා නිසි පරිදි දායක මුදල් අදාල ගිණුම් වලට බැර කිරීමටත් බදුකරු කටයුතු කළ යුතුය.

**22. හානි හා පාඩු සම්බන්ධ අයකිරීම**

I. බදුකරු ඔහුගේ සේවකයින්ගේ නොසැලකිල්ල නිසා සුභසාධක ආපනශාලාව පිහිටි ගොඩනැගිල්ලට සිදුවන අලාභ හානි සම්බන්ධව බදුකරු වගකිව යුතුය.

II. මෙම ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියාවන් හා සවිකිරීම් සිදුකිරීම ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ලබන අතර බදුකරුට ගොඩනැගිල්ලේ කිසිදු වෙනස් කිරීමක් කිරීමට බලය නැත්තේය.

**23. සුභසාධක ආපනශාලාව පවත්වාගෙන යාමේ වෙනත් කොන්දේසි**

I. රාජකීය උද්භිද උද්‍යානයේ කාර්ය මණ්ඩලයට හා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට සහන මිලට ආහාර පාන සැපයිය යුතු අතර ලංසු ලියවිලි සමග ආකෘති අංක 2 හා 3 මගින් එම මිල ගණන් පැහැදිලිව වෙන් වෙන්ව ඉදිරිපත් කල යුතුය.

II. කැසට් යන්ත්‍ර, ගුවන් විදුලි, රූපවාහිනි ආදි සියලු ශබ්දවාහිනි වල හඩ සුභසාධක ආපනශාලාව පවතින පරිශ්‍රයට පමණක් සීමා විය යුතුය.

III. ලංසුකරු විසින් ගෙන එනු ලබන උපකරණ ගෘහභාණ්ඩ කිසිවක් වේ නම් ඒවා පිළිබඳව ලැයිස්තුවක් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

IV. බදුකරු සුභසාධක ආපනශාලාවෙහි ගොඩනැගිල්ල, ආලින්දය, ගෘහ භාණ්ඩ සහ ඒ අවට භූමි භාගය දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදුව තබා ගත යුතු අතර පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

V. සුභසාධක ආපනශාලාවෙහි ආහාර සහ එහි ගෘහ භාණ්ඩ යනාදිය මැස්සන් සහ මීයන්ගෙන්ද වෙනත් කෘමි සතුන්ගෙන්ද තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලුම සෞඛ්‍ය විදි අනුගමනය කල යුතු අතර සෞඛ්‍ය අධිකාරි විසින් දී ඇති උපදෙස් හා වරින් වර රජය විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

VI. සුභසාධක ආපනශාලාවෙහි ඉතිරිවන ආහාරපාන සහ කැලිකසල යනාදිය දිනපතා ඉවත් කිරීමට බදුකරු කටයුතු කළ යුතුය. මේ සඳහා මහනුවර මහ නගර සභාවේ උපදෙස් මත සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. මෙසේ කටයුතු කිරිමට බදුකරු අපොහොසත් වුවහොත් මසක කල්දීමකින් යුතුව බදු ගිවිසුම අවසන් කොට කාර්ය සාධන ඇපකරය රාජ සන්තක කිරීමට ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

VII. සුභසාධක ආපනශාලාවෙහි වැසිකිළි පහසුකම් උසස් අන්දමින් පවත්වා ගැනීම පිණිස අවශ්‍ය කරන භාණ්ඩ ලංසුකරු විසින් සපයා ගත යුතු අතර පවිත්‍රතා සේවා නිසි පරිදි පවත්වාගත යුතුය.

VIII. සංචාරකයින් උනන්දුවක් දක්වන ශ්‍රී ලංකා අත්කම්, විසිතුරු භාණ්ඩ, ප්‍රකාශන, අත්‍යවශ්‍ය සෞඛ්‍ය හා සනීපාරක්ෂක භාණ්ඩ ආදිය ආපන ශාලාව තුළ අලෙවි කළ හැක. නමුත් ඒ සඳහා දෙපාර්තමේන්තු නාමය හෝ නිල සලකුණ භාවිතය සපුරා තහනම් වේ. එසේ භාණ්ඩ අලෙවි කිරීමට අදහස් කරන්නේ නම් රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතුයි. එම භාණ්ඩ අලෙවි කළ යුත්තේ නිෂ්පාදකයා සඳහන් කළ මිලට පමණි.

IX. නමුත් ස්වර්ණාභරණ, මැණික්, රෙදිපිළි හෝ වෙනත් සාප්පු භාණ්ඩ විකිණීම සපුරා තහනම්ය.

X. ලංසුකරු රජයට ගෙවිය යුතු බදු ගෙවන බවට තහවුරු කළ හැකි වර්ෂ 2ක බදු සහතික පිටපත් ඉදිරිපත් කිරීම අමතර සුදුසුකමක් ලෙස ඇගයීමට භාජනය කරනු ලැබේ.

XI. එයට අමතරව ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම සුභසාධක ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධව වරින්වර පනවනු ලබන නීතිරීති රෙගුලාසි හා උපදෙස් අනුව කටයුතු කිරිමටද බදුකරු බැඳී සිටි.

24. **කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ තීරණය සම්බන්ධයෙන් සියලුම ලංසුකරුවන් ලංසු ප්‍රධානයට පෙර දැනුම්දෙනු ලබන අතර අතෘප්තියට පත් යම් අසාර්ථක වූ ලංසුකරුවෙක් වේ නම් සාර්ථක ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමේ තීරණයට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5 ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත රු.10,000.00 ක නැවත නොගෙවන මුදලක් ගෙවා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පොදු 172 වවුචර්යක් ලබා අභියාචනයක් ලබා දෙන කාළ සීමාව තුල ඉදිරිපත් කල හැක.**

ඉහත සඳහන් කොන්දේසි වලින් බැඳී සිටීමට මම එකග වෙමි.

.........................................
ලංසුකරුගේ අත්සන
(රබර් මුද්‍රාව)

දිනය :- ..............................................

ලංසුකරුගේ නම සහ ලිපිනය :-
.......................................................................................................................
.......................................................................................................................
.......................................................................................................................
දුරකථන අංකය :- නිවස :- ...........................................................................
ජංගම දුරකථනය :- .........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :- .............................................................................. (පිටපතක් අමුණන්න)